**දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල - 2014**

---------------------------------------------------------------------------------

දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවල (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ප්‍රමිති අංක 01 ක ප්‍රකාරව ආදායම් හා වියදම් අයිතම එකිනෙකට හිලව් නොකර වෙන වෙනම හෙළිදරව් කළ යුතුයි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී කල් පිරුණු ආයෝජන සඳහා රු. 125,174 ක් ද, කල් නොපිරුණු ආයෝජන සඳහා රු. 27,932 ක් ද වශයෙන් පොළී ආදායමෙන් අඩුකළ රඳවාගැනීමේ බදු එකතුව රු. 153,106 ක් වියදම් යටතේ වෙනම හෙළිදරව් නොකර බදු අයකළ පසු ශුද්ධ අගය පොලී ආදායම වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණි.

**(ආ)** ප්‍රමිති අංක 02 කට අනුකූලවන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ මුදල් හා මුදල් හා සමාන දෑවල වටිනාකම රු. 23,151,414 ක් වුවද, එය රු. 22,693,987 ක් ලෙස දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු බලපා තිබුණි.

- **(i)** මාර්ගස්ථ මුදල් ඇතුළුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන මුදල් ශේෂයන් පිළිවෙලින් රු.9,617,742 ක් හා රු. 32,769,156 ක් වුවද, එම වටිනාකම් පිළිවෙලින් රු. 11,850,507 ක් හා රු. 34,544,490 ක් වශයෙන් දක්වා තිබුණි.

- **(ii)** සමාලෝචිත වර්ෂයේ මුදලින් ලැබූ ආදායම් එකතුව රු. 24,432,793 ක් හා වියදම් එකතුව රු. 6,266,258 ක් වීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් වටිනාකම රු. 18,166,535 ක් වුවද, ශුද්ධ මුදල් ගලා ඒම රු. 4,285,574 ක් වශයෙන් දක්වා තිබුණි.

- **(iii)** සමාලෝචිත වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ගලා ඒම රු. 4,984,878 ක් වුවද, ලිපිද්‍රව්‍ය තොග වැඩිවීම රු. 4,301,952 ක් මුදල් ගලා යාමක් ලෙස ඊට ගලපා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් වටිනාකම රු. 682,926 ක් වශයෙන් දක්වා තිබුණි.

- **(iv)** සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය යටතේ මුදල් ප්‍රවාහයන් ඇති බවට නිරීක්ෂණය නොවූවද, ණයගැතියන්ගේ හා ණයහිමියන්ගේ වැඩිවීම රු. 17,725,487 ක මුදල් ගලා ඒමක් දක්වා තිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම් හා නිකුත් කිරීම් නිසි පරිදි තොග ලේඛනයට ඇතුළත් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලිපිද්‍රව්‍ය තොග ලෙජරයේ වටිනාකම රු.20,305,951 ක් ද, භෞතික තොග ශේෂය රු. 20,837,578 ක් ද විය. මෙම තොග ශේෂයන් දෙකෙහි වෙනස රු.531,627 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායමක් වශයෙන් සළකා තිබුණි.

(ආ) බැංකු සංගම්වලට අලෙවි කළ ලිපිද්‍රව්‍ය සඳහා වර්ෂය අවසානයට ලැබිය යුතු මුදල් රු.10,333,675 ක් සඳහා ද නොයිපයූ ලාභය ගණනය කර ඇති බැවින් නොයිපයූ ලාභය රු.939,425 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. තවද, ඒ ආකාරයට වර්ෂය ආරම්භයේදී ද නොයිපයූ ලාභය රු. 554,578 ක් වැඩියෙන් ගලපා තිබීම හේතුවෙන් ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ලාභය රු. 384,847 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අගරු චෙක්පත් වටිනාකම රු. 80,500 ක් ණයගැති ගිණුමට ගැලපීම වෙනුවට, ලිපිද්‍රව්‍ය පිරිවැය වටිනාකම රු.73,182 ක් ලිපිද්‍රව්‍ය තොග ගිණුමෙන් හා ලාභය රු. 7,318 ක් ලිපිද්‍රව්‍ය අලෙවි ලාභයෙන් අඩුකර දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. 119,962 ක කාර්යාලීය උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබීම හේතුවෙන් ශුන්‍ය අගයට දක්වා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී එම උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ඇතුළත් කිරීමට හෝ නීත්‍යානුකූලව ඉවත් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 763 | නිලධාරීන්ට මඟ පෙන්වීම හා නාස්තිය අවම කිරීම මගින් තොග පාලනය කාර්යක්ෂම කිරීම සඳහා ගබඩා ව්‍යවස්ථාවක් සම්පාදනය කර නොතිබුණි. |
| **(ආ)** | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | එකතු කළ අගය මත බදු මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වැනි දිනට වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ වැට් බදු වටිනාකම රු. 533,088 ක් විය. |
| **(ඇ)** | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 (ආ) ඡේදය | අරමුදල පවත්වා ගෙන යාමේ රෙගුලාසි හඳුන්වාදීමට හා අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2.4 ලැබිය යුතු ගිණුම්**

ලංකා සළුසල ආයතනයට අයත් ගබඩාවේ ගබඩා කර තිබූ ලිපිද්‍රව්‍ය තොග 2010 වර්ෂයේදී ඉවත් කර ගෙන තිබූ නමුත්, ඒ සඳහා ගෙවා තිබූ ගබඩා කුලී තැන්පතුව රු. 1,454,112 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,285,574 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 3,499,143 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 786,431 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට වියදම් කිසිවක් දරා නොතිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

අරමුදලේ කාර්යයන් සඳහා පූර්ණකාලීනව යොදවා ඇති කාර්යමණ්ඩලයේ වැටුප්, ගබඩා පවත්වා ගෙන යාමේ වියදම් හා අනෙකුත් පොදුකාර්ය වියදම් රජය මඟින් දරනු ලැබුවද එම වියදම් රජය වෙත ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 22 දින ඉදිරිපත් කිරීමට කටයුතු කළද පැවති අඩුපාඩු හේතුවෙන් නිවැරදි කරන ලද මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 04 දින නැවත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ප්‍රමාද කාලය වර්ෂ 4 ක් ඉක්මවා තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.